
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam

## ඉන්දියාවට බයිබලයෙන් පාඩමක්

**මේ** නත්තල් සමයයි. ඒනිසා මෙවර මෙය ලියන්නට බයිබලයේ සඳහන් වන ශුද්ධවූ කියුම් ගැන සිත යොමන්නට මට සිතිණ. බයිබලයේ නව ගිවිසුමේ, ශාන්ත පාවුලු තුමාගේ කොටසේ, එතුමා ගලාතිවරුන්ට යැවූ හසුනක මෙසේ සඳහන් වේ.

*" දෙවියන් වහන්සේ නොරැවටේ. රැවටෙන්නේ නුඹලාමය. නුඹලා නෙලාගන්නේ නුඹලා විසින්ම වපුරන ලද දේය." -* ***ගලාති* 6-7**

සති දෙකකට පෙර ඉන්දියාවේ සිදුවූ මහත් ත්‍රස්තවාදී ව්‍යසනය අපට ද මුලුමහත් ලෝකයාට ද දැකගන්නට හැකිවිය. නවීන තාක්ෂණයට පිංසිදුවන්නට බොම්බායේ (දැන් මුම්බායි)174 දෙනෙකු ඝාතනය කෙරී, 294 දෙනෙකු තුවාල ලැබූ ඒ අවාසනාවන්ත සිද්ධිය රූපවාහිනියෙන් තත්පරයක් ගානේ විකාශනය විය. රුදුරු ත්‍රස්තවාදයේ බිහිසුණුකම විනා සහනදායී කිසිවක් නැත. ත්‍රස්තවාදීන් ළඟ දයා කරුණාවක් නැත. විනාශය පමණය. මේ සත්‍යය වසර 30 ක් පුරා කොටි ත්‍රස්තවාදයට මුහුණ දෙන ශ්‍රී ලංකාවාසී අපි හොඳින් දැන සිටිමු.

ඉහතකී මුම්බායි ත්‍රස්තවාදීන් මැඩපවත්වන්නට ඉන්දියානු විශේෂකායඃ බලකාය ගන්නා උත්සාහය දුටු මගේ සිතට ඉහතකී බයිබල් කියුම නිතැතින්ම සිහියට නැගිණ. එනම් ඉන්දියාව නෙලාගත්තේ ඔවුන්ම වැපිරූ දේ ය. මෙතෙක් කල් රැවටී සිටියේ ඉන්දියාවම ය. තමන් මහා මොළකාරයින් යයි ඉන්දියාව සිතා සිටියත් ඔව්හු අන්ත මෝඩයෝ වෙති.

80 දශකයේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් පෝෂණය කරමින් උන්ට ආහාර නවාතැන් සපයමින් පමණක් නොව ඉන්දියානු හමුදාවේම ආධාර ඇතිව මදුරාසියේ කඳවුරු පිහිටුවා කොටි ත්‍රස්තවාදීන් පුහුණු කළේ ඉන්දියානු රජයයි. ඉන්දියාවේ සහයෝගය ලැබෙන බව දන්නා කොටියෝ ඉවක් බවක් නැතිව ලංකාවේ සිංහළ ගම් වලට පැන සිංහළ වැසියන් අමු අමුවේ මරා දැමූහ. බෝම්බ පුපුරවා රටේ දේපළ විනාශ කළෝය. මැති ඇමතිවරුන් ඇතුලු ප්‍රභූවරු ඝාතනය කළෝය. ඉන්දියාව රහසිගතව කොටින්ට කිරිපොවමින් උන් පෝෂණය කළාය. ප්‍රභාකරන් මහ කොටියා අල්ලන්නට ඔන්න මෙන්න කියා තිබියදී ලංකාවට ගුවනින් පරිප්පු දමා ලංකා රජය බියවද්දා එම මෙහෙයුම නතර කෙරුවිවා ය. ලංකාවේ විනාශයට පරිහානියට ඉන්දියාව විශාල වශයෙන් වගකිව යුතු ය.

ඉන්දියාව නෙලා ගත්තේ එදා ඔවුන් වැපිරූ ත්‍රස්තවාදයේ අස්වැන්නයි. ඉන්දියාවට මින්පසු සුවසේ නිදාගත නොහැකි ය. ඒ දඬුවමට නිසැකවම ඔවුන් සුදුස්සෝ ය.

# කිතු උපත සිහිකරන නත්තල

**පෘ**තුගීසි භාෂාවෙන් නත්තල් යන වචනය අපට ලැබුණු අතර මෙය ලතින් බසින් **නතාලිප්** යනුවෙන් හඳුන්වනු ලබයි. මේ උත්සවය ඉංග්‍රීසි බසින් ක්‍රිස් - මස් Christ - Mass යන දෙපදය එක්ව සෑදුණු විට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව විශේෂ දේවපූජාවක් යන අදහස ඉදිරිපත් කෙරේ. නත්තල් උත්සවය ප්‍රථමයෙන් පවත්වනු ලැබුවේ ක්‍රි. ව. 137 දී ය. එවකට පාප්ධූරය දැරූ මැලස්පෝරස් හිමිපාණන් නියම කළ බැව්ද ලියැවී තිබේ. ක්‍රි ව 337 - 352 දක්වා ශුද්ධවූ සුප්‍රකට පෘතුගීසි දේශාටකයෙකු වන වස්කෝදගාමා 1497 වසරේදී නත්තල් දිනයේම සොයාගත් රටක් ලෝක සිතියමේ ඇති බව ඔබ දන්නවාද? එය නේටලය හෙවත් ටෙරා නටාලිස් (Terra Natalis) යනුවෙන් හැඳින්වේ. එය දකුණු අප්‍රිකානු සමූහාණ්ඩුවේ නැගෙණහිර ප්‍රාන්තයේ තිබෙන රටකි.

අපි නම් නත්තල් දිනයේ ගවලෙන සොයාගෙන එයින් සංකේතවත් වන දිළිඳුකම බැගෑපත්කම නමැති උත්කෘෂ්ඨ ධර්මගුණය අවබෝධකර ගනිමු.



සභාව පාලනය කළ පළමුවන ජූලියස් පාප්තුමා දෙසැම්බර් 25 වෙනිදා මෙය පැවැත්වීම යුතු බැව් නියෝග කළේය. එහෙත් සමහර ක්‍රිස්තියානි සභා එයට විරුද්ධව පරණ පිළිවෙල, එනම් ජනවාරි 6 වෙනිදාට නත්තල සිදුකිරීමට තරයේ ඉටා ගත්හ. සකල ක්‍රිස්තියානීන් විසින් දෙසැම්බර් 25 වෙනිදා නත්තල පැවැත්වීමට පටන්ගන්නා ලද්දේ ක්‍රි. ව. 1580 දී පමණ ය.

නත්තල් සුබපැතුම්පත් යැවීම දැන් නම් කා අතරත් කෙරෙන කටයුත්තකි. මුල් කාලයේදී එනම් ක්‍රි.ව. 1850දී පමණ මෙය සිදුවූයේ බීක්කු හැඩයට කපන ලද කඩදාසියක මැද රොබින් නමැති පක්ෂියාගේ රූපය ඇඳ එයට යටින් තමාට අවැසි සුදුසු සුබපැතුමක් ලිවීමෙනි.

නත්තල් සීයා පැමිණීම නිසා එකල ළමෝ ළපැටියෝ ඉමහත් සතුටින් ඉපිලී ගියහ. නොයෙක් කෙළිබඩු නත්තල් සීයාගේ බෑගයේ දමා රාත්‍රි කාලයේ දරුවන්ගේ සයනාගාරය ළඟ ඒවා දමා යෑම නත්තල් සීයාගේ පුරුද්ද විය. අද ඒ පුරුද්ද ඉටු කරනුයේ දෙමාපියන් මය.

එදින කෙරෙන විශේෂ උත්සව නම් ස්වාමිවරු සිය මෙහෙකරුවන්හට සංග්‍රහ පැවැත්වීම, අසරණයන්ට සරණ වීම, පවුලේ අය එකතුවීම ආදියෙන් සමස්ථ ලෝකයා නත්තල් ප්‍රීතියභක්ති විඳින හැටි ඔබ අප කවුරුත් දන්නා හොඳින් කරුණකි.

ගලීලයේ නාසරත්හි දහඅට හැවිරිදි ඉතා කාරුණික රූමත් තරුණියක් වූවාය. ඇ නමින් මරියාය. ජෝකිම් සහ ආනාගේ එකම දියණිය වූ ඇය සිය දෙමාපියන්ට යටහත්ව කීකරුක ගෙදර වැඩකටයුතු වලට සහාය වෙමින් කල්ගෙවූ තැනැත්තියකි. නාසරත් නුවර විසූ දාවිත් රජ පරපුරෙන් පැවත ආ තරුණයෙකි. ඔහු ජෝෂප් ය. 32 වියැති ඔහු ද යහපත්ව හැදුණු වැඩුණු කෙනෙක් විය.

කන්‍යාවියකව සිටි මරියා දෙවිඳුන්ට ප්‍රසන්නව, දේව අභිමතයට අවනතව සිටියදී දෙවිපියාණන් විසින් ගේබ්‍රියල් නම් දේවදූතයා ඇ වෙත එවන ලද්දේය. " විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගලවේ. ස්වාමීන් වහන්සේ ඔබ සමග ය" යි කීය. එවිට බියට පත් මරියා මෙහි තේරුම කිමෙක් දැයි සිතුවාය. නැවත ගේබ්‍රියල් නම් දේවදූතයා පෙනී සිට ඇය අමතා මෙසේ කීවේය. " මරියාවෙනි, බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාද ලද්දීය. ඔබ පුතෙකු ලබන්නීය. ඔහුට ජේසුස් යන නාමය තබන්න."

අද අප සමරණ නත්තල නම් මෙය වේ. එනම් ක්‍රිතුස් වහන්සේගේ උපත සිහිකිරීමයි.

ඔබ සැමට අසිරිමත් නත්තලක් වේවා!

♦ ***ප්‍රින්ස් කෲස් කන්‍යා සොහොයුරිය***
**පෙරියමුල්ල මීගමුව Sri Lanka**

## ලොව ප්‍රථම නත්තල් සුබපැතුම්පත මෙයයි!

**මු**ද්‍රණයකර බෙදා හරින ලද ලොව ප්‍රථම නත්තල් සුබපැතුම් නිර්මාණය වූයේ එංගලන්තයේ ය. ජෝන් කැල්කොට් හෝර්ස්ලි නම් තැනැත්තා එය ඇඳ මුද්‍රණය කළේ ඔහුගේ මිතුරෙකුවූ ධනවත් ව්‍යාපාරිකයෙකු වන සර් හෙන්රි කෝල්ගේ ඉල්ලීමක් අනුවය. හෙන්රි කෝල් ට නත්තල් සමයේ සිය ගණුදෙනුකරුවන්ට සහ වෙනත් ව්‍යාපාරික මිතුරන්ට සුබ පතා පණිවුඩයක් යවන්නට අවශ්‍ය බව කී නිසා ජෝන් කැල්කොට් ඒ සඳහා පින්තාරුවක් නිර්මාණය කළේය. එහි දැක්වුණේ




සාමාන්‍ය වික්ටෝරියානු ඉංග්‍රීසි පවුලක පිරිස කා බී විනෝද වන ආකාරයයි. කාඩ් දාහක් ඉන් මුද්‍රණය කරන ලද අතර, එකක් සිලිමක් ගණනේ අලෙවිකරන ලදී. මෙය ලොව මුද්‍රණයකර එළි දක්වන ලද ප්‍රථම නත්තල් සුබ පැතුම් පත ලෙස සැලකේ.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### *හිතොපදේශයෙන්*

**න සා භායෙඃති වක්තව්‍යා - යස්‍යා භර්තා න තුෂ්‍යති**
**තුෂ්ටෙ භර්තරි නාරීණාම් - සන්තුෂ්ටා සර්ව දෙවතා**

***අර්ථය*** : **යම් භාර්යාවක් කෙරෙහි ස්වාමියා සතුටු නොවේද, ඕ භාර්යාවකැයි කිව නොහැකිය. ස්වාමියා සතුටු වූ කල්හි ස්ත්‍රීන්ට සියළු දේවතාවෝ සතුටු වෙති.**

**මා**නව ප්‍රජාවගේ පැවැත්ම අඹු-සැමි දෙපළගේ යහ පැවැත්ම මත රඳා පවතීයයි කීම නිවරදය. සමාජ සංස්ථාවේ මුල්ම හා වැදගත්ම සබඳතාව ස්වාමි-භාර්යා සම්බන්ධතාවයි. එහි වැදගත්කම හා නොවැදගත්කම, හරවත්බව හා නිසරුබව හෝ ශක්තිමත්බව මත පවුල් සංස්ථාවේ ස්ථිර බව රඳා පවතී. එහි අස්ථිරබව හෝ ලිහිල්බව පවුල් සංස්ථාව දෙදරායාමේ අවදානම කරා ගමන්කිරීමේ හැකියාව වැඩිවන්නේය.

හැම නිවසකම හෝ හැම පවුලකම වැදගත්කම හෝ දියුණුව, සතුට සමාදානය ආදී ධනාත්මක අංගයන්හි ප්‍රවර්ධනයට හේතුවන්නේ අඹු සැමි දෙපළගේ මනා පැවැත්මයි. ගෙදරක සිරියාව හෝ සැපසම්පත උදාවන්නේ එම දෙපළගේ ගුණවත්බව නිසයි.

වසර ගණනාවක් පෙරුම්පුරා, පෙම්කර හෝ නොකර, අහම්බෙන් හෝ සිදුවන විවාහ දෙදරා යාමේ තර්ජනයන් වළකාලීමට දෙපාර්ශවයම තරයේ ඉටාගත යුතුය. එම වගකීම අඹුව හෝ සැමියා තනිව භාරගත යුත්තක් නොවේ. අඩුපාඩු අඩු වැඩි වශයෙන් දෙදෙනා තුළම පැවතිය හැකිය. එහෙත් ඒවා වහා සමනය කර ගැන්ම දෙදෙනාගේම යුතුකමයි.

අඹු සැමි සබඳතා දෙදරා යාම අද සමාජයේ බහුලය. එමෙන්ම පෙරදිගට වඩා බටහිර සමාජයේ මෙය නිතර අසන්නට ලැබෙන්නකි. ඇතැමුන් විවාහය විනෝදයක් ලෙස කරන බව පෙනේ. විවාහය සුළු කලකට සීමාවීම කණගාටුවට කරුණකි. ඒ ගැන වැඩියෙන් සිතීමට කාලය එළඹ ඇත. හුදෙක් ආස්වාදය සඳහාම විවාහවන්නේ නම් එබඳු අයගේ ඉරණම විසඳෙන්නේ ප්‍රශ්න දහසක් මතුකරමිනි.

අද බොහෝ පිරිමි කාන්තා පැත්තෙන් ලැබෙන දෑවැද්දට ගිජුව විවාහ වෙති. විවාහ යෝජනාවත් සමග බලන්නේ ඇගේ ගුණ යහපත්බව නොව දෑවැද්දේ වටිනාකමයි. ඇතැම් තරුණියන්ද සොයන්නේ තරුණයාගේ යහපත්කම ගැන නොව ඔහුගේ වත්පොහොසත්කම් ගැනයි. එබඳු විවාහ වල ද ආයුෂ කෙටිය.

තවත් කෙනෙක් හැමදාම අසමගියෙන් අසතුටින් කල් ගෙව්වත් ලෝකාපවාදය නිසාම ඒවා රහස් ලෙස සඟවා තබා ගනිති. ටික දෙනෙක් පමණක් රන්රස මෙන් බැඳී සතුටින් සමාදානයෙන් ජීවිතාවසානයතෙක් කල් ගෙවති. පොදුවේ බලන විට සමාජයේ බිඳුණු පවුල් ගණන අප්‍රමාණය. එය දරුවන්ට මෙන්ම ඥාතීන් ඇතුළු හැම දෙනාටම බලවත් අනතුරකි. සමාජ පැවැත්මට බලවත් තර්ජනයකි.

ඉහත දැක්වෙන පද්‍යයෙන් විස්තර කර ඇත්තේ අඹුසැමි දෙපළගේ සතුටයි. යම් භාර්යාවක් ස්වාමියා සතුටු නොකරන්නේ නම් ඇය භාර්යාවක් නොවේ. මෙහි සඳහන් නොකළ ද, ස්වාමියා සම්බන්ධව ද එසේ ම ය. දෙදෙන අන්‍යොන්‍ය වශයෙන් සතුටු කිරීමෙන් පවුල් දිවිය යහපත්ව ගෙන යා හැකිය. එමෙන් එවැනි තන්හිදි දෙවියන් පවා සංතෝෂ වනබව දැක්වීමෙන් සැමි-බිරි සබඳතාවේ උතුම් බව හුවා දක්වා ඇත.

♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue**
**London W41UD UK**




**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**